# සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2020

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## භාණ්ඩ හා සේවා සැපයීම, අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සහ කොන්ත්‍රාත්තු

2020 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයීම, අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සහ කොන්ත්‍රාත් වැඩ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වීමට කැමති පිළිගත් නිෂ්පාදකයින්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් / බෙදාහරින්නන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## වර්ගය I

### කාණ්ඩ අංක 01 - භාණ්ඩ

1. ගොඩනැගිලි උපකරණ සහ සාමාන්‍ය ලෝහ භාණ්ඩ
2. ආපනශාලා අවශ්‍යතා සහ මුළුතැන්ගෙයි උපකරණ
3. කැමරා සහ වීඩියෝ කැමරා අමතර කොටස්
4. බුමුතුරුණු (රබර් / රෙදි)
5. රෙදි මලු (කාසි දැමීම සඳහා)
6. සන්නිවේදන උපකරණ, ආශ්‍රිත උපාංග හා වෙනත් අවශ්‍යතා
7. පරිගණක, පරිගණක ආශ්‍රිත උපකරණ හා මෘදුකාංග
8. පරිගණක අවශ්‍යතා සහ මුද්‍රණ කඩදාසි
9. වායු සමීකරණ වල සිසිලන කුළුණු සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය (Cooling Tower Chemicals)
10. විදුලි භාණ්ඩ හා උපාංග
11. සෝෆා සහ තිර රෙදි සඳහා රෙදිපිළි
12. මල් පෝච්චි (සිමෙන්ති, ප්ලාස්ටික් ආදිය)
13. ආහාර ද්‍රව්‍ය (මාළු, කරවල, සීනි, මස් හා බිත්තර, තේකොළ, කිරි සහ කිරි නිෂ්පාදන, සහල්, එළවළු, බේකරි නිෂ්පාදන, රස කැවිලි, පළතුරු, ඕට්ස් යනාදිය)
14. ගෘහ උපකරණ (ලී, වානේ සහ ෆයිබර් ග්ලාස්), ගින්නෙන් ආරක්ෂා වන සේප්පු හා කැබිනට්
15. ක්ෂණික අත් පිරිසිදු කිරීමේ උපකරණ
16. සනීපාරක්ෂක අවශ්‍යතා
17. ලොකු පොලිතීන් මලු (කැබලි කළ අභාවිත මුදල් නෝට්ටු දැමීම සඳහා)
18. පිඟන් සෝදන යන්ත්‍ර සඳහා දියර සබන්
19. පුස්තකාල අවශ්‍යතා (පොත්, පුවත්පත්, උපකරණ හා උපාංග)
20. බෙහෙත් ද්‍රව්‍ය, රසායනාගාර උපකරණ, ශල්‍ය උපකරණ ඇතුළු වෛද්‍ය අවශ්‍යතා
21. ජංගම දුරකථන
22. මෝටර් වාහන සඳහා අමතර කොටස්, බැටරි, ටයර්, ටියුබ් සහ වෙනත් අවශ්‍යතා
23. කාර්යාලයීය උපකරණ (ඡායා පිටපත් යන්ත්‍ර, චෙක්පත් එන්කෝඩර්, චෙක් ලිවීමේ යන්ත්‍ර, තැපැල් මුද්‍රා තැබීමේ යන්ත්‍ර, නෝට්ටු සහ කාසි ගණන් කරන / වර්ග කරන/ පරීක්ෂා කරන යන්ත්‍ර, විශාලන කාච, පාරජම්බුල ලාම්පු, මුදල් ප්‍රවාහනය කිරීමේ පෙට්ටි.)
24. කාර්යාලයීය ලිපිද්‍රව්‍ය හා අවශ්‍ය කරන අනෙකුත් ද්‍රව්‍ය සහ ඡායා පිටපත් යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර සඳහා ටෝනර් සහ කාට්‍රිජ්
25. මුද්‍රණාල අවශ්‍යතා
26. ආරක්ෂිත උපකරණ
27. ආරක්ෂක උපකරණ (භාණ්ඩ තොග, ගමන් මලු සහ වාහන නිරීක්ෂණය කිරීමේ උපකරණ, වාහන කළමනාකරණ පද්ධති, වෝකි ටෝකි යන්ත්‍ර, පුපුරණ ද්‍රව්‍ය සහ ලෝහ අනාවරණ උපකරණ, වාහන බාධක, ගිනි නිවීමේ උපකරණ, CCTV සහ රාත්‍රී දර්ශක ආරක්ෂක කැමරා, මහජන ඇමතුම් පද්ධති, ප්‍රවේශ පාලන පද්ධති යනාදිය)
28. ආරක්ෂක නිල ඇඳුම් සහ උපාංග (නිල ඇඳුම්, සාරි, නිල ලාංඡන, මේස්, නළා පටි, බඳ පටි, නේම් ටැග්ස්, නිල ඇඳුම් සඳහා උර පළඳනා, වැහි කබා, සපත්තු පොලිෂ්, කුඩ යනාදිය)
29. ක්‍රීඩා ඇඳුම් සහ පැළඳුම් (ට්‍රැක් බොටම්ස්, ටී ෂර්ට්ස්, ජොගිං ෂූස් යනාදිය)
30. බඳින පටි - පොලිතීන් බන්ඩ්ලර් ෆොයිල්ස්, බෑන්ඩිං පේපර් රීල්ස් (මුදල් නෝට්ටු ඇසිරීම සඳහා)
31. ඉගැන්වීමේ /පුහුණු කිරීමේ උපකරණ
32. රෙදිපිළි හා සම්භාණ්ඩ නිෂ්පාදන, මේස රෙදි සඳහා රෙදිපිළි

### කාණ්ඩ අංක 02 - සේවා

1. ගුවන් ප්‍රවේශපත්‍ර සැපයීමේ සේවා
2. ආහාරපාන සැපයීමේ සේවා
3. සංයුක්ත තැටි පිටපත් කිරීමේ සහ මුද්‍රණය කිරීමේ සේවා
4. ක්ලියරිං හා ෆෝවර්ඩිං සේවා
5. උත්සව කළමනාකරණ සේවා
6. ප්‍රදර්ශන ශාලා ඉදිකිරීම හා අභ්‍යන්තර සැළසුම්කරණය
7. ගෘහ පාලනය සහ කාමර සේවා
8. පිරිසිදු කිරීමේ සහ පීඩාකාරී සතුන් මර්දනය කිරීමේ සේවා
9. රෙදි සේදීමේ සේවාව
10. විශේෂ අවස්ථා සඳහා ප්‍රධාන ආහාර, කෙටි ආහාර සැපයීමේ සේවා
11. තැපැල් කාමර සේවාව කළමනාකරණය, දේශීය සහ විදේශීය ලිපි සහ පාර්සල් බෙදා හැරීමේ සහ උපකරණ ප්‍රවාහන සේවා (කුරියර් සර්විස්)
12. මාධ්‍ය ප්‍රචාරක සේවා
13. නැවුම්/කෘත්‍රිම මල් සැකසුම් හා බඳුන් ගත කළ පැල වර්ග සැපයීම, කාර්යාලයීය ලීබඩු කුලියට සැපයීම, පලංචි කුලියට සැපයීම සහ බැංකුවෙන් ඉවත් කළ යුතු ප්‍රවෘත්ති පත්‍ර, සඟරා, ලී පැලට්, ලී පෙට්ටි හා කාඩ්බෝඩ් පෙට්ටි, අබලි ද්‍රව්‍ය හා යකඩ ආදිය මිලට ගෙන ඉවත් කිරීම ඇතුළු අනෙකුත් සේවා
14. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සේවා (ගුවන් විදුලි සේවා, රූපවාහිනී නාලිකා, පුවත්පත් හා සඟරා යනාදිය)
15. මුද්‍රණ සේවා
16. ප්‍රචාරණ සහ වෙළෙඳ දැන්වීම් සේවා
17. භෝජනාගාර සේවා
18. තිර රෙදි සහ මේස රෙදි මැසීම
19. නාම පුවරු / දැන්වීම් පුවරු
20. මෘදුකාංග යෙදුම් සංවර්ධනය
21. භෝජන සංග්‍රහ පුටු, මේස සහ කූඩාරම් (Huts) සැපයීම
22. පානීය ජලය සැපයීම
23. නිවාඩු නිකේතන කළමනාකරණ සේවා සැපයීම
24. කොන්ත්‍රාත් පදනම මත ශ්‍රමය සැපයීම (ආරක්ෂක සේවා, පින්තාරු, පෙදරේරු, වඩු කාර්මික ආදිය)
25. භාණ්ඩ එහා මෙහා කිරීමේ සේවා සැපයීම (ගෘහ භාණ්ඩ / කාර්යාල භාණ්ඩ / සේප්පු )
26. නිල ඇඳුම් මැසීම
27. කාර්යාලයීය සේවකයන් ප්‍රවාහනය සඳහා වායු සමීකරණ පහසුකම් සහිත ප්‍රවාහන සේවා (කැබ් සේවාව)
28. වීඩියෝ නිෂ්පාදන ආයතන
29. වෙබ් අඩවි නිර්මාණය, සැකසීම සහ ධාරක සේවාව (hosting)

## වර්ගය II

### කාණ්ඩ අංක 03 - අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු

1. ගොඩනැගිලි පිරිසිදු කිරීම (වහල, වැහි පීලි, ලාම්පු ආවරණ සහ බිම ඔපදැමීම)
2. තීන්ත ආලේපනය
3. කැමරා සහ වීඩියෝ කැමරා අලුත්වැඩියා කටයුතු සහ සේවා කටයුතු
4. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් උපකරණ (වායු සමීකරණ උපකරණ, හදිසි සංඥා පද්ධති, ජෙනරේටර්ස්, PABX සහ ප්‍රධාන දුරකථන පද්ධති, මහජන ඇමතුම් පද්ධති, ශීතකරණ, ශබ්දවාහිනී පද්ධති සහ VHF සන්නිවේදන උපකරණ)
5. භූමි අලංකරණය හා උද්‍යාන නඩත්තුව
6. ආරක්ෂක උපකරණ නඩත්තු කිරීම (භාණ්ඩ තොග, ගමන් මලු සහ වාහන නිරීක්ෂණය කිරීමේ උපකරණ, වාහන කළමනාකරණ පද්ධති, වෝකි ටෝකි යන්ත්‍ර, පුපුරණ ද්‍රව්‍ය සහ ලෝහ අනාවරණ උපකරණ, වාහන බාධක, ගිනි නිවීමේ උපකරණ, CCTV සහ රාත්‍රී දර්ශක ආරක්ෂක කැමරා, මහජන ඇමතුම් පද්ධති, ප්‍රවේශ පාලන පද්ධති යනාදිය)
7. සෝෆා අලුත්වැඩියාව සහ කුෂන් කිරීම
8. විදුලි බලයෙන් ක්‍රියාත්මක වන ගේට්ටු සහ දොරවල් අළුත්වැඩියා කිරීම
9. අභාවිත මුදල් විනාශ කිරීමේ යන්ත්‍ර සහ ඒවායේ අමතර කොටස්, ෆෝක් ලිෆ්ට්, පැලට් ට්‍රක්ස්, ස්ටැකර්ස් නඩත්තු කිරීම
10. ලී බඩු අලුත්වැඩියාව (දොර / ගෘහ භාණ්ඩ)
11. ලී බඩු ඔප දැමීම
12. මුද්‍රණ යන්ත්‍ර
13. පෞද්ගලික පරිගණක හා පරිගණක ආශ්‍රිත උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම
14. වාහන (වායු සමීකරණ අලුත්වැඩියා කිරීම, යාන්ත්‍රික හා විදුලි වැඩ, ටින්කරින් සහ ස්ප්‍රේ තීන්ත ගෑම, සේවා කටයුතු, ඇතුළත පිරිසිදු කිරීම, කාපට් සහ කුෂන් කිරීම, වීල් එලයිමන්ට්, වීල් බැලන්සින් සහ කැම්බර් ඇන්ගල් කිරීම, වාහන ආරක්ෂක පද්ධති සවි කිරීම)

### කාණ්ඩ අංක 04 - කොන්ත්‍රාත්තු

1. සිවිල්
2. විදුලි
3. අභ්‍යන්තර සැරසිලි
4. යාන්ත්‍රික

## කොන්දේසි

1. දැනටමත් බැංකුවේ ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන්/ බලයලත් බෙදාහරින්නන්, නිෂ්පාදකයින් / කොන්ත්‍රාත්කරුවන් ද 2020 වර්ෂය සඳහා ලියාපදිංචිවීමට අලුතෙන් ඉල්ලුම් කළ යුතුය.
2. ඉදිකිරීම්, අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (CIDA) හෝ ශ්‍රී ලංකා තැනීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ (ACCSL) ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉදිකිරීම් වැඩ සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලැබේ.
3. සිවිල් ගුවන් සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි වී ඇති ගුවන් ගමන් නියෝජිත ආයතනවලට පමණක් ගුවන් ප්‍රවේශපත්‍ර සැපයීමේ සේවා සඳහා ලියාපදිංචිවීමට සුදුසුකම් ලැබේ.
4. ආරක්ෂක සේවා සැපයීම සඳහා සහ ආරක්ෂක නිලධාරීන් සැපයීම සඳහා පළාත් සභාවල / ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලියාපදිංචි වූ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලත් ආයතන පමණක් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබයි.
5. අයදුම්කරු කොන්දේසි අංක 2, 3 සහ 4 සපුරන බව සහතික කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලිවල පිටපත් සුදුසු පරිදි පුරවන ලද අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.
6. අයදුම්පත් කොළඹ 01, ශ්‍රී ලංකා මහ බැංකු ගොඩනැගිල්ලේ 4 වන මහලේ (බිම් මහලේ) පිහිටි තැපැල් කාමරයෙන්, එක් අයිතම කාණ්ඩයක් සඳහා වන පෝරම ගොනුවකට ආපසු නොගෙවන රු.500/- ක මුදලක් සමග ව්‍යාපාරික ලිපි ශීර්ෂය සහිත ලිඛිත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැකි ය. එක් එක් කාණ්ඩ අංක සඳහා නියමිත පෝරම භාවිත කර පමණක් අයදුම් කළ යුතුය. අයදුම්පත්‍ර ගෙවීමකින් තොරව පරීක්ෂා කළ හැකිය.
7. මුදල් බාර ගැනීම සහ අයදුම්පත්‍ර නිකුත් කිරීම 2019.11.08 දින දක්වා රාජකාරී දිනයන්හිදී උදේ 9.00 සිට සවස 3.00 දක්වා සිදු කෙරෙන අතර අයදුම්පත් බාර ගැනීම 2019.11.15 දිනෙන් අවසන් වේ.
8. එක් කාණ්ඩයකට වඩා ලියාපදිංචිවීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් එක් එක් කාණ්ඩය සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර එවිය යුතු අතර ඒවා සියල්ල එක් ලියුම් කවරයක බහා එවිය යුතුය.
9. සියලුම අයදුම්පත් "2020 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම" යනුවෙන් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කොට, "ලේකම්, ලේකම් දෙපාර්තමේන්තුව, 11 වන මහල, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01" වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
10. මිල ගණන් සාමාන්‍යයෙන් කැඳවනු ලබන්නේ ලියාපදිංචි බලයලත් බෙදාහරින්නන්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන්/ නිෂ්පාදකයින්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන් ගෙනි. එසේ වුවද, (අ) ලියාපදිංචි නොවූ බලයලත් නියෝජිතයින්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන්/ නිෂ්පාදකයින්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේ හා (ආ) ලියාපදිංචිවීම සඳහා ඉල්ලා ඇති අයගේ විශ්වාසවන්තභාවය කෙරෙහි සෑහීමකට පත් නොවුවහොත් එම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතු වෙයි.
11. ඉල්ලුම් කළ විට ක්ෂණිකව මිළ ගණන් ඉදිරිපත් නොකරන හෝ කලට වේලාවට භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත් වන, එසේනැතහොත් සෑහීමකට පත් නොවිය හැකි ආකාරයේ භාණ්ඩ හා සේවා සහ අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සපයන ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නම් ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කරනු ලැබේ.
12. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ප්‍රසම්පාදන අංශයේ සහකාර ලේකම්ගෙන් (දුරකථන අංක 011-2477123) ලබාගත හැකිය.

**ලේකම්**
**ශ්‍රී ලංකා මහ බැංකුව**